Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

## මගෙන් වචනයක්..

සමහර යාලුවො කියනවා නේ ජීවිතෙ දිනන්න විභාග පාස් වෙන්නම ඔනි නෑ කියල.මෝටිවීශන් අයියල අප්පච්චිලා එම.හරි ඇති.

ඉතින් විභාග ෆේල් වුන හැම මිනිහම ජීවිතෙ දිනුවද බං ? ඔයා හිතනවද ඔයාගෙ අනික් යාලුවො පාස් කියල කියද්දි ඔයා ෆේල් කියල හරි ඔයා අඩු සාමාර්ථ අරන් තියෙද්දි හරි ඔයාට දැනෙන හැඟීම ලස්සන එකක් වෙයි කියල..ඔයාගෙ අම්මට අප්පච්චිට දැනෙන හැගිම ලස්සන එකක් වෙයි කියල.

එක එකාගෙ වැල් බයිලා වලට යට වෙන්-නැතුව ඔයාගෙ ජීවිතේ අඩියක් හරි ඉස්සරහට එන්න හොදට විභාගේ ගොඩ දාගන්න.ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙ-පා.සහභාගි වෙලා ෆේල් ලකුනක් අරන් වැඩක් නෑ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!



Design by - Creativepixel.lk - Search us on fb/insta

දහවැනි පාඩම

# සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය

Communication Policy and Media Regulation

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්

HNDIT , mass communication (UG)

076 3950730

071 0538308

## 10. සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය

### සන්නිවේදන ප්‍රතිපත්ති

සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ රාජ්‍ය බලධාරීන්ගේ තීරණ යොමු කෙරෙන පොදු මූලධර්ම වලට සන්නිවේදන ප්‍රතිපත්ති යන යෙදුම භාවිනා වේ. සිවිල් නිදහස හා මානව අයිතිවාසිකම් කෙරෙහි බලපෑම ඇති වන විට සන්නිවේදන ප්‍රතිපත්නති පුරවැසි ප්‍රතිපත්තියේ කොටසක් බවට පත්වේ.

සන්නිවේදන ප්‍රතිපත්ති රටාව සකස් කරනු ලබන්නේ තත්සමාජයේ පවත්නා සම්මත දේශපාලනික හා සමාජීය තත්ත්වයන්ට අනුකූල-වයි.

1927 දි බි.බි.සි.ආයතනය පිළිබද බ්‍රිතාන්‍ය රාජකීය ප්‍රඥප්තිය මගින් මහා බ්‍රිතාන්‍ය සහ යටත්විජිතවල ගුවන්විදුලි මාධ්‍ය හැසිරවීම පිළිබද ප්‍රතිපත්තිය හඳුන්වා දි තිබේ.

1934 අමෙරිකා එක්සත් ජනපදයේ සම්මත කරන ලද සන්නිවේදන පනත මගින් ඇමෙරිකාවේ ගුවන්විදුලිය රූපවාහිනිය විදුලි සන්දේශ හා විදේශ සන්නිවේදනය සඳහා පෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව ඇති කරනු ලැබිය.

සන්නිවේදන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සදහා පවත්වන ලද ප්‍රථම සම්මන්ත්‍රණය 1976 කොස්තාරිකාවේ සැන්ජෝස්ගි දි පවත්වනු ලැබිය.

1970 දශකයේ දි අගභාගයේ දි නොබෙල් සාම ත්‍යාගලාභි ශෝන් මැක්බ්‍රයිඩ්ගේ සහභාගිත්වයෙන් යුනෙස්කෝ සංවිධානය විසින් ගෝලිය මාධ්‍ය නිරූපණය වඩාන් සාධාරණීකරණය කිරීමට මැක්බ්‍රයිඩ් කොමිසම ආරම්භ කරන ලදි.

1964 දි විල්බර් ශ්‍රාම් ජාතින් අතර ප්‍රවෘත්ති ගලනය පිළිබද අදහස් දක්වමින් සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රවෘත්ති අඩු අවධානයක් හා යථාර්ථය විකෘති කිරීමක් කරන බව ප්‍රකාශ කර ඇත.

යුනෙස්කෝ සංවිධානය විසින් නිකුත් කරනු ලැබූ මැක්බ්‍රයිඩ් වාර්තාව දක්වන ආකාරයට රටක සන්නිවේදන ප්‍රතිපත්නි සකස් විය යුත්තේ අසමානතා දුරු කිරීමටය.

යුනෙස්කෝ සංවිධානය ව දක්වන ආකාරයට සන්නිවේදන ප්‍රතිපත්ති මගින් ලැබෙන ප්‍රතිලාභ අතරණී සමාජ දුරස්ථභාවය අවමවීම සාමය හා සමානාත්මතාවය ඇති කිරීම දැක්විය හැකිය.

රටක මාධ්‍ය ප්‍රතිපත්තිය සකස්වන්නේ පුළුල් වශයෙන් සන්නිවේදන ප්‍රතිපත්නි ඇසුරිනි. මාධ්‍ය ප්‍රතිපත්තිවල අන්තර්ගත වන්නේ.

මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය
තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
මහජනතාව සමග මාධ්‍ය සම්බන්ධතාව
මාධ්‍ය අධිකාරින් හා වෙළඳපොළ නියාමනය.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවබෝධය සහ මනුෂ්‍ය ප්‍රජා අතර සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීමට ප්‍රකාශ කිරීමේ නිදහස සහතික කිරීම මගින් විවිධ සංස්කෘති හා ප්‍රජා අතර සමගිය ප්‍රවර්ධනය කිරීමට සියලුම මාධ්‍ය ආයතනවල කාර්යභාර්ය ස්වාධින කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම.

ආචාර්ය ධර්ම හා සදාචාරාත්මක මාධ්‍යවේදී පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ ස්වාධීන යාන්ත්‍රණය නිර්මාණය කිරීමෙන් මාධ්‍ය ක්ෂේත්‍රයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම පිණිස.

### - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

1948 දෙසැම්බර් 10 දින පැරිසියේ පවත්වන ලද එක්සත් ජාතීන්-ග මහා මණ්ඩලය විසින් මෙම ප්‍රකාශණය එළි දක්වන ලදී. ඒ අනුව සෑම වසරකම දෙසම්බර් 10දින විශ්ව මානව හිමිකම් දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

11 ලෝක යුද්ධයේ අත්දැකීම් වල ප්‍රතිඵලයක් ලෙස මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය බිහි විය.

මෙම විශ්ව ප්‍රකාශනය ආරම්භ වන්නේ මිනිස් සමාජයේ සියලු සාමාජිකයන්ට නෛසර්ගික ගෞරවයණී නිදහස හා යුක්තිය සමාජ පදනම බව පිළිගනිමිනි.

සන්නිවේදනයට අදාළ කොටස 19 වන වගන්තිය වේ.

19 වන වගන්නිය – තම මනය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් සෑම කෙනෙකුටම ඇත. බාධා කිරීම්වලින් තොරව මනිමතාන්තර දැරීමේන් සීමා මායිම් නො සළකා කවර හෝ මාධ්‍යක් මගින් තොරතුරු හා අදහස් සෙවීමේ ලබා ගැනිමේ හා බෙදා හැරීමේ නිදහස මේ අයිනියට ඇතුළත්ය.

### - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව අනුව එහි 11 වන පරිච්ඡේදයේ 10 වැනි වගන්නියේ සිට 14 වගන්නිය දක්වා මූලික අයිතිවාසිකම් අන්තර්ගත වේ.

14(1) ( අ) වගන්නිය

සෑම පුරවැසියෙකුටම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුලු අදහස් පළ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය.

එමෙන්ම මෙම වාවස්ථාව මගින් ඉහත ආකාරයට අදහස් පළ කිරීමට ලබා දි ඇති නිදහසට සීමාවන් පනවා තිබේ. එම සීමාවන් පනවා තිබෙන්නේ 15(1) සහ 15(2) වගන්ති වලිනි.

15(1) 13 වවන ව්‍යවස්ථවේ (5) වවන සහ (6) වන අනුව්‍යවස්ථා වලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විදිය හැක්කේ ද ක්‍රියාත්මක කළ හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නිතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්වය.මෙම අනු වාවස්ථාවේ කාර්ය සඳහා නිතිය යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ අදාල වන නිතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේය.

15 (7) 12 වන ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වචන හා (2) වන අනුව්‍යවස්ථා වලින් 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් භුක්ති විදිය හැක්-ක් ද ක්‍රියාත්මක විය හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාච-ාරය ආරක්ෂා කිරීම පිණිසත, අනයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදැරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමා-ජයක පොදු ශුභ සාධනය සඳහා යුක්තිසහගත ව අවශ්‍ය දෑ සපුරා ලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය. මේ අනුවාවස්ථාවේ කාර්ය සඳහා නීතිය යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ ව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය.

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් තොරතුරු අයිතිය ද මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇත.

### - 2003 බුද්ධිමය දේපල පනත

යම් කිසි පුද්ගලයකු විසින් බිහිකරනු ලබන නිර්මාණාත්මක අං-ගයක් බුද්ධිමය දේපළක් වශයෙන් හඳුන්වනු ලැබේ. නිදසුනක් ලෙස නිර්මාණකරුවෙකු විසින් බිහි කරනු ලබන නව චිත්‍රපටයක්, නව කථාවක්, පරිගණක වැඩසටහනක්, ගීතයක්, මූර්තියක්, බුද්ධිමය දේපලක් වශයෙන් හැඳින්විය හැකිය.

මෙම පනතේ 06 වන වගන්තිය සුවිශේෂී වේ. මෙම වගන්නිය මගින් සාහිත්‍ය කලාත්මක සහ විද්‍යාත්මක ක්ෂේත්‍රවල මුල්ම බුද්ධිමය නිර්මාණ සඳහා ආරක්ෂාව සලසා ඇත. මෙම පනත මගින් නිර්මාණකරුවෙකුට ප්‍රකාශන හිමිකම දෙයාකාරයකින් හිමිකර දී ඇත. එනම් ආර්ථික අයිතිවාසිකම් සහ සදාචාරාත්මක අයිතිවාසිකම් වශයෙනි.

මෙම පනතේ 9(1) වගන්නිය ද වැදගත් වේ. එමගින් නිර්මාණයක හිමිකරුට පමණක් හිමිවන අයිතිවාසිකමක් පිළිබඳව සඳහන් වේ. එනම් ආර්ථික අයිතිවාසිකමයි

### - 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත

තොරතුරු දැන ගැනීමේ පනත ශ්‍රී ලංකාව තුළ 2016 වර්ෂයේ දී සම්මත කරගත් සුවිශේෂී පනතකි. මෙතුළින් මහජනයාට රාජ්‍ය ආයතන වලින් තමන්ට අවශ්‍ය තොරතුරක් ලබා ගැනීමේ ඇති අයිතිය තහවුරු කරයි.

එමෙන්ම රාජ්‍ය අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලු කටයුතු සම්බන්ධයෙන් ජනතාවට අවශ්‍යවන තොරතුරු ලබාදීමට මෙමගින් අදාල රාජ්‍ය ආයතනය බැඳී සිටී. එහෙත් රාජ්‍ය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධ තොරතුරු, සංවේදී තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට ද රජයකට හැකිය. මෙම කටයුතු මෙහෙයවීමට සහ පැමිණිලි විභාග කිරීම සඳහා 2017 පෙබරවාරි 02 දින තොරතුරු දැන ගැනීමේ කොමිසම පිහිටුවනු ලැබිය.

### 10.2 මාධ්‍ය නියාමනය

නියාමනය යන්න තවදුරටත් විද්‍යාත්මකව විග්‍රහ කළහොත් මහජන ආයතනයක් විසින් ප්‍රජාවගේ පිළිගැනීමට ලක් වූ ක්‍රියාකාරකම් පිළිබඳව බල පවත්වනු ලබන ඉලක්ක ගත පාලනයක් නියාමනය-ක් ලෙස හැඳින්විය හැකිය. එමෙන්ම නියාමනය නූතන මාධ්‍ය කර්මාන්තයේ භාවිත වන කැපී පෙනෙන සංකල්පයක් වශයෙන් ද හැඳින්විය හැකිය.

මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාවය

- තොරතුරු සමාජයක පවතින්නා විවිධ සන්නිවේදන විධික්‍රම යනු ආර්ථික සම්පතකි. ඒවා ඒවා කළමනාකරණය කිරීමට නියාමනය අවශ්‍ය වේ.

- මහජන සාමය ආරක්ෂා කිරීමට.

- පාලනය නොකරන ලද පොදු මහජන සන්නිවේදන ක්‍රම මගින් තනි
පුද්ගලයන්ගේ අයිතියට සිදුවන බලපෑම පාලනය කිරීමට.

- තාක්ෂණික ප්‍රමිතිකරණයණි නවෝත්පාදනයණි අන්තර් සම්බන්ධතා මත පදනම් වූ සන්නිවේදන ක්‍රමවේද වල සං-වර්ධනයට සහ ඵලදායී භාවිතයට.

- තමන් තෝරා ගත් සන්නිවේදනාත්මක හා සංස්කෘතික භාවිතය මත පදනම්ව තොරතුරු වෙත ප්‍රවේශ වීම සන්නිවේදනයේ නිදහස විවිධත්වය සහ විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනයට නියාමනය වැදගත් වේ.

- මාධ්‍ය සේවාවල නිදහස් වෙළඳපල භාවිතය, ප්‍රවේශවීමේ තරගකාරිත්වය, පාරිභෝගික අයිතිය පවත්වාගෙන යාමට

### නියාමන වර්ග

1 ස්වයං නියාමනය
2 සහනියාමනය
3 ව්‍යවස්ථාපිත නියාමනය
4 අභ්‍යන්තරික නියාමනය

### ස්වයං නියාමනය

මාධ්‍ය රාජ්‍ය මැදිහත්වීමකින් තොරව මාධ්‍ය මගින් ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන ක්‍රියාත්මක වන නියාමන ක්‍රියාවලියකි.

### සහනියාමනය

මාධ්‍ය නියෝජිතයන්ගේ කැපී පෙනෙන මැදිහත්වීමක් සහිතව නීතිය මගින් ස්ථාපිත කරන ලද නියාමනය සහනියාමනය වේ.

### ව්‍යවස්ථාපිත නියාමනය

මාධ්‍ය ආයතනවල මැදිහත්වීමක් හෝ සහභාගිත්වයක් නොමැතිව ක්‍රියාත්මක කරනු ලබන නියාමන විධි ක්‍රියාවකි. සිවිල් සමාජ කණ්-ඩායම්, නිනිඥ සංගම්, ශාස්ත්‍රීය පර්යේෂකයෝ නියාමන මණ්ඩලවල සමාජිකත්වය දරති. ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තුව මගින් හෝ කිසියම් මණ්ඩලයක් විසින් මේ සඳහා සාමාජිකයන් පත් කරයි. මොවුන් මාර්ගෝපදේශ සකස් කිරීම හා ඊට අදාළ නිරීක්ෂණ කටයුතු සිදු කරයි.

**අභ්‍යන්තරික නියාමනය**
ඇතැම් ආයතන නම නියාමන ක්‍රියාවලිය ආයනන මට්ටමෙන් අභ්‍යාන්තරිකව පවත්වා ගෙන යයි. ඒ සඳහා මාධ්‍ය ආයතන තම ආයතනය වෙනුවෙන් ඔම්බුස්මන්වරයෙකු පත් කරයි. මේ සඳහා ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවරයෙකු තෝරා ගනු ලබයි. මාධ්‍ය ආයනනය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සංස්කාරකවරුන්ට දැනුම්දීමටත් ගතයුතු පියවර නිර්දේශ කිරීමත් ඔම්බුස්මන්වරයාගේ කාර්යය වේ.

**මාධ්‍ය නියාමන ආයතන**

- ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය
- ශ්‍රීලංකා පුවත්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- ශ්‍රීලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

**ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය**

1972 ඉංග්‍රීසි යටත් විජිත පාලන කාලයේ පනවන ලද තීරණයකින් ආරම්භ වූ ක්‍රියාවලියකි. සංදර්ශනණී ප්‍රසංගණී චිත්‍රපට යනාදිය මගජන ප්‍රදර්ශනයට පෙර නිරීක්ෂණය කර ඊට අදාළ නියාමන කටයුතු වල යෙදීම මෙහි මූලික අරමුණ වේ. සිනමා කෘතියක් හෝ වේදිකා නාට්‍යයක් මහජන ප්‍රදර්ශනයට තැබීමට පෙර මුලින් එහි පිටපතක් ද නිෂ්පාදනය කළ පසුව මුල් දර්ශන ද
රැගුම් පාලක මණ්ඩලයට නැරඹීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යට-නේ මෙය පවත්වා ගෙන යනු ලැබේ.මෙම මණ්ඩලය පුද්ගලයන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා නිලබලයෙන් පත් කරයි. සෙසු සමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත් කරයි.

පුවත්පත් වල වෘත්තිය තත්ත්වය ඉහල නැංවීමණී පුවත්පත් නිදහස ආරක්ෂා කිරීමණී පුවත්පත් ආචාර ධර්ම පවත්වා ගෙන යාමණී පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ හැගීමක් ඇති කිරීම මෙහි මූලික පරමාර්ථ වේ.

**ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සන්දේශ(සංශෝධිත) පනත යටතේ ස්ථාපිත ආයතනයකි. විද්‍යුත් මාධ්‍ය ලෙස සැල-කෙන ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍ය නියාමනය සඳහා පිහිටවූ ආයතනයකි. එමෙන්ම ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා ප්‍රචාරයට අවශ්‍ය ගුවන්විදුලි තරංග පරාසයන් ලබාදීමේ බලතල ඇත්තේ ද මෙම ආයතනයට වේ. එමෙන්ම ගුවන්විදුලි තරංග පරාසය-න් නැවත පවරා ගැනීමේ හෝ තහනමට ලක් කිරීමේ බලතල ද මෙම ආයතනය සතුවේ. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ අවසරයකින් තොරව ගුවන්විදුලි හෝ රූපවාහිනී සම්ප්‍රේෂණයේ යෙදීම තහනම් වේ.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා කර්තෘ සංසදයණී නිදහස් මාධ්‍ය ව්‍යාපාරයණී පු-වත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය යන ආයතන ඒකාබද්ධව පිහිට වූ ආයතනයකි. මෙය ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයට අනුබද්ධව 2003 වසරේ දී පිහිටවනු ලැබීය.

ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ස්වේච්ඡාවෙන් සකස් කර ඇති වෘත්තීය ප්‍රතිපත්ති මාලාව කිසියම් පුවත්පත් කතුවරයකු හෝ පත්‍රකලාවේදියෙකු කඩ කළ විට ඊට එරෙහිව හානි වූ තැනැත්තාට පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැකිය. මෙහිදී අගතියට පත් මහජනතාවගෙන් ලිඛිතව ලැබෙන පැමිණිලි විභාග කරනු ලබයි. මෙහිදී දෙපාර්ශ්වය කැඳවා
ප්‍රශ්නය සමථයකට පත් කිරීමට අධිකරණය මගින් බේරුම් කිරීම සාමදාන කිරීමට පුවත්පත් පැමිණිලි කොමිසම මැදිහත් වෙයි.

**ශ්‍රී ලංකා පරිගණක හඳිසි ප්‍රතිචාර සංසදය**

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
නියෝජිත ආයතනය විසින් යටතේ 2006 වර්ෂයේ දී පිහිටුවන ලද ආයතනයකි. රටේ ජාතික සයිබර් ආරක්ෂණ ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.

එමෙන්ම විවිධ සංවිධාන සහ පුද්ගලයන් විසින් සිදු කරනු ලබන සයිබර් අපරාධ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සිදු කරයි.

මෙම සංසදයේ කාර්යයන් අතර මුලා හා වෙනත් අපරාධ පිළිබඳව විමර්ශනය කිරීමණී ත්‍රස්තවාදී සංවිධාන වල ක්‍රියාකාරීත්වයට එරෙහිව දැනුවත් කිරීම අනතුරු හැගවීම විසඳුම් ලබාදීම වැදග න් වේ.

මෙයට අමතරව පරිගණක ගැටලු සම්බන්ධයෙන් වන මහජන පැමිණිලි විමර්ශනය කර ඊට අදාළ විසඳුම් ලබාදීම සිදු කරයි.

10.3 මාධය ආචාරධර්ම හා මාධ්‍ය මාර්ගෝපදේශය

**- මාධ්‍ය ආචාරධර්ම**
20 වැනි සියවසේ මාධ්‍ය භාවිතය සමග වැඩුණු ප්‍රධාන ධාරාවක් ලෙස මාධ්‍ය ආචාරධර්ම හැඳින්විය හැකිය. මාධ්‍ය ආචාර ධර්ම සකස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් විෂය මූලික බවණී වගකීම සාධාරණබව යනාදිය පිළිබඳව සලකා ලබනු ලැබේ. එමෙන්ම මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක්

හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ වගකීම් සහගත මාධ්‍ය භාවිතයෙන් යුත් වෘත්තිකයෙකු බිහිකර ගැනීමයි.

**- මාධ්‍ය මාර්ගොපදේශ**
බොහෝ මාධ්‍ය ආයතන විසින් තම මාධ්‍ය ආයතනය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව විවිධ නිර්නායක ඉදිරිපත් කර තිබේ. මෙම නිර්නායකයන්ට අනුගත වෙමින් අදාළ මාධ්‍ය
ආයතනයේ පුද්ගලයන් කටයුතු කළ යුතු වේ. මේවා මාධ්‍ය මාර්ගොපදේශ වශයෙන් හැඳින්විය හැකිය.

**- පුවත්පත් ආචාර ධර්ම**

- 1973 අංක 05 දරුණු ශ්‍රී ලංකාව පුවත්පත් මණ්ඩල පනත යටතේ 1981 දී පුවත්පත් කලාවේදීන්ට ආචාරධර්ම සංග්‍රහය හදුන්වාදීම

- 2003 – ශ්‍රී ලංකා කතෘ සංසදය මගින් – වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම

**- ගුවන්විදුලි ආචාරධර්ම**

- 1966 අංක 25 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත

- වැඩසටහන්කරණයේ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සංස්ථාවේ ගුවන්විදුලි නාලිකා වලට අදාල මඟපෙන්වීම
- ගුවන්විදුලි සඳහා සකස් කර ඇති දැන්වීම් ලබා ගැනීමේදී පිළිපැදිය යුතු පටිපාටිය

**- රූපවාහිනි ආචාරධර්ම**

- 1982 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත
- වැඩසටහන්කරණයට අදාල කොටස් කිහිපයකට මගපෙන්වීම
- දැන්වීම් ලබා ගැනීමේ දී අනුගමනය කරන මාර්ගොපදේශ සංග්‍රහය

**- නව මාධ්‍ය ආචාර ධර්ම**

- පොදු මාර්ගොපදේශ නැත.
- එක් එක් වෙබ් අඩවි වල හා සමාජ ජාල වල නමන්ට ගැලපෙන ලෙස සකස් කළ මාර්ගොපදේශ ඇත.